කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී (ආර්ථික විද්‍යා) තුන්වන වසර විභාගය - 2018

(දෙවන සෙමෙස්තර අවසානය)

# ENH 3242/ELT 3250 - පාරිභෝගික අධ්‍යනය හා අලෙවිකරණය

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. සියලු ප්‍රශ්න සඳහා සමාන ලකුණු ඇත.

කාලය: පැය දෙකයි (02)

---

1. "පරිභෝජන රටාවන් තිරසාර කරගැනීම වර්තමාන මනුෂ්‍ය වර්ගයා මුහුණපාන ප්‍රධාන අභියෝගයක් වේ. ඒ සඳහා රජයන්, පුද්ගලික ආයතන හා කුටුම්බයන්ගේ කාලීන හා එකමුතු ක්‍රියාකලාපයන් අවශ්‍යවේ."
   - i. තිරසර පරිභෝජනය යනු කුමක්ද?
   - ii. සමාජයක පරිභෝජන රටාවන් සඳහා බලපාන ප්‍රධාන සාධක මොනවද?
   - iii. ඔබ සිතන ආකාරයට තිරසර පරිභෝජන න්‍යාය පත්‍රය සමග සිවිල් සමාජයට ඉදිරියට ගමන් කල හැකි ආකාර නම් කරන්න.

2. "පාරිභෝගික වරණයන් පාරිභෝගික හැසිරීම් රටාවෙහි වැදගත් කොටසකි."
   - i. පාරිභෝගික වරණයට සම්බන්ධ ප්‍රධාන උපකල්පන හතර (4) මොනවද ?
   - ii. හීනවන අන්තික උපයෝගිතා නියමය හා පරිභෝජනය අතර පවතින සම්බන්ධතාවය කුමක්ද ?
   - iii. පරිභෝජන හැසිරීම් රටාවන් විග්‍රහ කිරීමේදී හීනවන අන්තික උපයෝගීතා න්‍යායෙහි සීමාකම් මොනවද?

3. A හා B යනු විදේශ විනිමය සීමාවන්ගෙන් මිදීම සඳහා විවිධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින්සිටින සංවර්ධනය වෙමින් පවතින රටවල් දෙකකි. A සුඛෝපභෝගී පාරිභෝගික ආනයනය සීමා කිරීමට වෑයම් කරමින් සිටින අතර ඒමගින් ආනයන මිල වැඩි වී ඇත. B කෘෂි යෙදවුම් ආනයනය කිරීම උනන්දු කරන අතර ගොවීන්ට සහනාධාර ලබා දීම මගින් සමතුලිතතාවයට සාපේක්ෂව කෘෂිකාර්මික යෙදවුම්වල මිල අඩු වීමක් සිදු වේ.

   එක් එක් රටෙහි පාරිභෝගික සුබසාධනයට කුමක් සිදු වන්නේද යන්න පිළිබඳව ප්‍රස්ථාර දෙකක් භාවිතා කර විග්‍රහ කරන්න.

4. "සාමාන්‍යයෙන් පාරිභෝගිකයාගේ හැසිරීම තාර්කික වේ යැයි උපකල්පනය කලද, අධ්‍යනයන් මගින් හෙළිකරන පරිදි ඔවුන් ඇතැම් අවස්ථා වලදී තාර්කික තීරණ ගැනීමට අපොහොසත් වේ. එමෙන්ම පාරිභෝගිකයන් තාර්කික නම් බොහොමයක් අලෙවිකරුවන් තම භාණ්ඩ හා සේවාවන් ප්‍රවර්ධනය සඳහා මනෝ විද්‍යාඥයන් යොදාගන්නේ මන්ද යන්න ගැටලුවකි."

   i. තාර්කික තීරණ ගෙනිමේදී පාරිභෝගිකයන් මුහුණපාන ප්‍රධාන අභියෝග මොනවද?

   ii. තම ලාභ උපරිම කරගැනීමට ව්‍යාපාරිකයන් භාවිතාකරන මනෝවිද්‍යාත්මක සාධක මොනවද?

   iii. මෙම සාධකයන් සුපිරිවෙලදසැල් හා සාමාන්‍ය සිල්ලර වෙළඳසැල් තම ව්‍යපාර කරගෙන යාමේදී සලකා බලන්නේද?

5. සෑම රටකම පාහේ බොහෝ පාරිභෝගිකයින්ට ඔවුන්ගේ අයිතීන්, නීති සහ පාරිභෝගික භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු නොමැත. පාරිභොගික තෘප්තිය උපරිම කිරීම සඳහා පාරිභෝගිකයන්ට තොරතුරු පිළිබඳ මනා දැනුමක් අවශ්‍ය වේ.

   i. පාරිභෝගික අයිතිවාසිකම් යනු මොනවාද?

   ii. ගෝලීය යුගයේ පාරිභෝගිකයින් මුහුණ දෙන ගැටළු කෙටියෙන් විස්තර කරන්න.

   iii. ඕනෑම ගැටළු දෙකක් තෝරාගෙන ඒවා ජය ගැනීමට විසඳුම් යෝජනා කරන්න.

6. "ශ්‍රී ලංකාවේ උතුරු හා දකුණු ප්‍රදේශ වල ආහාර පුරුදු එකිනෙකාට වෙනස් වේ"

   i. ශ්‍රී ලංකාවේ උතුරු හා දකුණු ප්‍රදේශ වල වෙසෙන ජනයාගේ සම්ප්‍රදායික ආහාර රටාවන් මොනවද

   ii. කාලයත් සමග ශ්‍රී ලංකාවේ ආහාර පුරුදු වෙනස් වීමට විදේශීය සාධක කොතරම් දුරට බලපා තිබේද?

   iii. ඔබ සිතන ආකාරයට මෙම වෙනස්කම් කොතරම් දුරට ශ්‍රී ලංකා ආර්ථිකයට බලපා තිබේද?

7. පරිභෝජනය පිළිබඳ මිනිස් හැසිරීම් පිළිබඳ විවිධ න්‍යායන් තිබේ. පුනර්ජනනීය නොවන හා පුනර්ජනනීය සම්පත් පරිභෝජන රටාව සමාන විය නොහැකිය.

i. මිනිස් පරිභෝජන හැසිරීම් සම්බන්ධව ඇති න්‍යායන් ආකෘති තුනක් නම් කරන්න.

ii. පොදු භාණ්ඩ හා පෞද්ගලික භාණ්ඩ අතර වෙනස කෙටියෙන් සාකච්ඡා කරන්න.

iii. ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේදී ශ්‍රී ලංකාවේ මුහුණ දෙන ගැටළු (දේශපාලනික, නීතිමය, පරිපාලන, සමාජ සහ ආර්ථික) කවරේද? උදාහරණයන් ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

8. පහත සඳහන් කරුණු තුනක් (03) පිළිබඳ සවිස්තර සටහන් ඉදිරිපත් කරන්න

i. සක්‍රීය හා ප්‍රතික්‍රියාශීලී පරිභෝජනය (Proactive and reactive consumption)

ii. ආදේශක සහ අනුපූරක භාණ්ඩ (Substitute and complementary goods)

iii. පාරිභෝගික ආරක්ෂාව සඳහා නීති (Laws for consumer protection)

iv. Pavlovian ඉගෙනුම් ආකෘතිය (The Pavlovian learning model)

v. ෆෝඩිසම් (Fordisum)

vi. මහා පරිමාණ පරිභෝජනය (Mass consumption)

******